මානසික සමතුලිතතාවය බිඳ වැටීමක්, මානසික සංකූලතාවයක් හෝ රෝගයක් හැඳින්වීම සඳහා "පිස්සු" හෝ "පිස්සු වැටීම" වැනි යෙදුමක් කෙතරම් උචිත ද යන පැනය, Ethics Eye අපි මින් පෙරද පාඨක ඔබට ඉදිරිපත් කර ඇත්තෙමු. සමාජයේ තවමත් මානසික සංකූලතාවයන් හෝ රෝගයන් සම්බන්ධයෙන් පවතින පසුගාමී අදහසත්, එවැනි දේට මනෝ වෛද්‍ය ප්‍රතිකාර හෝ මානසික උපදේශනය ලබාගැනීමට තවමත් ඇතැමුන් තුළ පවතින පැකිළීමත් තවත් තීව්‍ර කිරීමට මෙවැනි යෙදුම් හේතු විය නොහැකිද යන පැනය පාඨක අප ඇසිය යුතුය.

මෙම පසුබිම යටතේ, "පිස්සු බෙහෙත් මත් ලෝලීන්ට විකුණූ යාපනයේ 3 ක් දැලේ" යනුවෙන් දිනමිණ පුවත්පතේ (ඔක්. 18, 2022) පළ වූ පුවත් සිරස්තලය විමසා බැලිය හැක.

1) සිරස්තලයක් නිර්මාණශීලීව නිර්මාණය කිරීමට ඇති අයිතිය සම්බන්ධයෙන් ගැටළුවක් නොමැත. එසේ වුවත්, "පිස්සු බෙහෙත්" වැනි යෙදුම් කෙතරම් යෝග්‍ය වේ ද?

2) ඒ වෙනුවට, පුවත් අන්තර්ගතය තුළ සඳහන් ආකාරයට, "මානසික රෝගීන්ට දෙන ඖෂධ" යන්න වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

** අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ඔබගේ දුරකථනයටම ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙක් වන්න!